# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2013/24 – 2017 අප්‍රේල් 05 වැනි බදාදා – 2017.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සියපත්තුව සුළු කොට්ඨාසයේ, වාරියපොල කොට්ඨාස අංක 10 - දියබුබුල (මාතලේ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/MTL/2015/185 හා 2015.09.18 දිනැති පූර්වගාමී අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – වාරියපොල වත්ත අක්කරමලේ කොටස – **ප්‍රමාණය: හෙක්. 0.0304**

උතුරට: ආර්. එච්. අන්වර්ඩීන් සහ තවත් අය හිමිකම් කියන වාරියපොල වත්ත අක්කරමලේ කොටස; නැගෙනහිරට: දියබුබුල ඔය සහ මාර්ගය; දකුණට: අයුබ් අන්සාරි සහ තවත් අය හිමිකම් කියන වාරියපොල වත්ත අක්කරමලේ කොටස; බටහිරට: මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2014/PC/339.
2017 මාර්තු මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

04 – 568

1A – G25387 – 07 (2017/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.